# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2220/39 - 2021 මාර්තු මස 23 වැනි අඟහරුවාදා - 2021.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

සුරාබදු නිවේදනය

**ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය**

සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 8 වන සහ 30 වන වගන්තිය සමග කියවිය යුතු 32 වන වගන්තියෙන් මුදල් විෂයභාර අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජුනි 20 දිනැති අංක 2128/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 04/2019 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරන ලද පරිදි, පහත රීති පනවන අංක 2178/4 දරන 2020 ජුනි 01 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 03/2020 දරන සුරාබදු නිවේදනය, 2020 සැප්තැම්බර් 10 දින පාර්ලිමේන්තුවේ සම්මත වූ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. 3 වන රීතියේ,
   - (අ) පළමු අතුරුවිධානයේ (ii) වන ඡේදයේ සඳහන් ''සැප්තැම්බර් 01, 2020'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''දෙසැම්බර් 31, 2020'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම, සහ
   - (ආ) දෙවන අතුරුවිධානයේ (ii) වන ඡේදයේ සඳහන් ''සැප්තැම්බර් 01, 2020'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''දෙසැම්බර් 31, 2020'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම.

13 වන රීතියෙහි සඳහන් ''දින තුන්සිය හතළිස් හතක් (347)'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''දින පන්සිය හැට එකක් (561)'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2021 මාර්තු මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04 - 533